# මගේ ලෝකය

ඇසෙන දැනෙන දේ..
හිතට වැදෙන දේ..



ජගත් ජේ එදිරිසිංහ

අයියා මේසය මත එළා ගත් ලොකු කඩදාසියක් මත යමක් අඳිමින් සිටියි. "බ්‍රවුන් පේපර්" නමින් එකළ හැඳින් වූ එක් පැත්තක් ඔපවත් වූ මේ කඩදාසි අප වැඩි වශයෙන් පාවිච්චි කළේ අභ්‍යාස පොත් වල කවර දමන්නට ය. කඩදාසියේ ඉහළින්ම අයියා ගේ මුතුවන් අකුරින් ලියැවී තිබුණේ "ළමා ලෝකය" කියා ය.

"මේ මොකක්ද?" මම ඇසුවෙමි.

"පත්තරයක් ..." අයියා කියයි

"පත්තරයක්..?"

"ඔව්.. බිත්ති පත්තරයක්.. "

අයියා ඒ කාලයේ ඉගෙන ගනිමින් සිටියේ මහරගම විද්‍යාකරයේ අට වන පන්තියේ ය. මා සිටියේ තලපත්පිටියේ උඩහමුල්ල රජයේ බෞද්ධ ප්‍රාථමික විද්‍යාලයයේ හයවන පන්තියේ ය. (අපේ ඉස්කෝලයේම ඉගෙන ගනිමින් සිටි, කුඩා කල සිටම පොත පත කියවා මහා දැනුම් සම්භාරයක් රැස් කරගෙන සිටි, දීප්තිමත් ශිෂ්‍යයකු වූ අපේ අයියා විද්‍යාකරයට ගියේ පහේ ශිෂ්‍යත්වය ඉහළින්ම සමත් වීම නිසා ය. ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළින් සමත් වූ අයියා ව රාජකීය, ආනන්ද, නාලන්ද වැනි නම ගිය පාසලකට ලෙහෙසියෙන්ම ඇතුල් කරන්නට හැකියාව තිබියදී මහරගම විද්‍යාකරයට දැම්මේ අපේ තාත්තා ය. මේ හිතුවක්කාර ක්‍රියාවට තාත්තා හැම දෙනාගෙන්ම ඇති තරම් දොස් අසා ගත්තේ ය. අයියා සාමාන්‍ය පෙළ විභාගයෙන් උසස් ලෙස සමත් වූ පසු නාලන්දාවට ඇතුල් කළේ ඒ නිසා විය යුතු ය)

> ***විද්‍යාව සහ ගණිත විෂයයන් පාඨකයාට රසවත් ලෙස ඉදිරිපත් කිරීමේ විවිධ ක්‍රම අපි අත්හදා බැලුවෙමු. විද්‍යාත්මක කරුණු කුඩා කතන්දර විලාසයෙන් චිත්‍රකතා විලාසයෙන් විවිධ ක්‍රියාකාරකම් විලාසයෙන් ඉදිරිපත් කිරීමට අපි***

"බිත්ති පත්තරයක් කියන්නෙ මොකද්ද?" මම අසමි

"ඉස්කෝලෙ ළමයි ලියපු ලිපි මේකෙ අලවනවා.. ඊට පස්සෙ මේක ඉස්කෝලෙ දැන්වීම් පුවරුවේ ගහනවා.. හැමෝමට කියවන්න පුලුවන් වෙන්න.. හැම මාසෙකටම සැරයක් අලුත් පත්තරයක් හදනවා.." අයියා විස්තර කරයි

මෙය අපූරු වැඩකි. අපේ ඉස්කෝලෙත් පත්තරයක් සෑදිය යුතු ය. බිත්ති පත්තරයක් කිරීමට නම් ඒ සඳහා ලොකු මහත්තයා ගෙන් අවසර ගත යුතුය. ස්වභාවයෙන්ම කුලෑටි ශිෂ්‍යයකු වූ මට ඒ සා විශාල කර්තව්‍යයක් කිරීමට තරම් ආත්ම ශක්තියක් නැත. ඒ නිසා ගුරුවරුන්ට නොදැනෙන තාලයෙන් මගේ පත්තරය පටන් ගත යුතු ය. වඩාත්ම හොඳ සිසුන් අතර අතින් අත යැවිය හැකි ආකාරයට පොතක් සේ පත්තරය සකස් කිරීමය.

මම මගේ අදහස ළඟම මිතුරාට කීවෙමි. ඔහු සිරිනිමල් අමරතුංග ය. (තරුණ වියේදී ගිහි ගෙයින් නික්ම ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණ කාලිකයකු වී මරණය වැළඳ ගත් මගේ මේ මිතුරා ගැන මම මෙයට පෙර ලියා ඇත්තෙමි.) ඔහු එකඟ විය. අයියා පත්තර හදන හැටි බලා සිට පත්තර පිළිබඳ මහා අද්දැකීමක් ලබා ඇති මම කර්තෘ වරයා වූයෙමි. සිරිනිමල් මගේ උප කර්තෘවරයා බවට පත් විය. පත්තරයට අලුතින් නම් සොය සොයා ඉන්නට අවශ්‍ය නැත . අයියා ගේ "ළමා ලෝකය" මේ වන විට නැවතී තිබුණ බැවින් මගේ පත්තරයට ඒ නමම තැබුවෙමි.

"ළමා ලෝකය" මාස දෙක තුනක් ගුරුවරුන්ට හොර රහසේ කරගෙන ගියත් එක්තරා දවසක උප විදුහල්පති වූ සේනාධීර මහත්තයා අතට පත්තරය පත් විය. මම ගැහෙන හදින් බලා සිටියදී සේනාධීර මහත්තයා අතින් ලියූ ලිපියක් මට ලැබුණි. පාසලේ දරුවන්ගේ මේ උත්සාහය තමා ඉතා ඉහළින් අගය කරන බවත් පුවත්පත දිගටම පවත්වාගෙන යන්නට සහයෝගයක් වශයෙන් රෝනියෝ කඩදාසි බණ්ඩලයක් පරිත්‍යාග කරන බවත් ඔහු ලියා තිබුණි. ලිව්වා වගේම මා අතට රෝනියෝ කඩදාසි බණ්ඩලයක් ද ලැබුණි.

මා මේ කුඩා කණිටු විදුහලින් අස්ව යන තෙක්ම අපේ පත්තයර " "ළමා ලෝකය" කරන්නට අපට සේනාධීර මහත්තයා දුන් කඩදාසි සෑහුණි.

පසු කලෙක කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේදී " මුතුහර" නමින් මුද්‍රිත සඟරාවක් පළ කළ නමුත් එය දිගටම පවත්වාගෙන යන්නට අපට නොහැකි විය.

නැවත මහා පරිමානයෙන් පුවත්පතක් අරඹන්නට අප අර අඳින්නේ ඉන් වසර කීපයකට පසුව ය. විද්‍යා අධ්‍යාපනය වෙනුවෙන් වෙන්වුණ පුවත්පතක් ඇරඹීම අපේ අරමුණ විය. මා සමඟින් "ළමා ලෝකය" බිත්ති පුවත්පත කළ සිරිනිමල් අමරතුංග මා සමග එක් විය. ඔහු මේ කාලයේ දී සිය ඥාතියෙකුට අයත් මුද්‍රණ බ්ලොක් සාදන සුප්‍රකට ආයතනයක සේවය කරමින් සිටියේ ය. ඒ නිසා පුවත්පතට අවශ්‍ය බ්ලොක් පහසු මිලකට සාදවා ගැනීමේ පහසුවක් අපට විය.

ජීව විද්‍යා අංශයෙන් බාහිර උපාධිය හදාරමින් සිටි සිරිනිමල් තවත් ඔහුගේ හිතවතුන් දෙදෙනෙකු ද අපට එක් කර ගත්තේ ය. ඔවුහු සුමිත් කරුණාරත්න සහ දයාවංශ ලියනගේ වූහ. අප අතරින් කිසිවකුට මුදුනා වීමේ අරමුණක් නොවීය. එනිසා අපි සතර දෙනාම නව පුවත්පතේ සම සංස්කාරකවරු වූයෙමු. පුවත්පත බෙදාහැරීමේ කටයුත්තට මගේ බාල සොහොයුරා මංගල ද එක් විය. මේ කාලය වන විට මගේ අයියා විද්‍යෝදය සඳුරසවියේ කරමින් සිටි විද්‍යා උපාධිය අතර මග නවතා ඉංජිනේරු උපාධියක් සඳහා රුසියාවේ මොස්කව් ලුමුම්බා විශ්ව විද්‍යාලයට ඇතුත් වී සිටි බැවින් ඔහුගෙන් සහයක් ලබා ගන්නට අපට නොහැකි විය.

පුවත්පතේ සැකැස්ම පිළිබඳව අපි බොහෝ සාකච්ඡා කළෙමු. අවසන බොහෝ සේ වාද විවාද කර පුවත්පතේ නම "විද්‍යාව" ලෙස තීරණය කළෙමු. විද්‍යාව සහ ගණිතය විෂයයන් පාඨකයාට රසවත් ලෙස ඉදිරිපත් කිරීමේ විවිධ ක්‍රම අපි අත්හදා බැලුවෙමු. විද්‍යාත්මක කරුණු කුඩා කතන්දර විලාසයෙන් චිත්‍රකතා විලාසයෙන් විවිධ ක්‍රියාකාරකම් විලාසයෙන් ඉදිරිපත් කිරීමට අපි වෙහෙසුණෙමු.
ඒ කාලයේ ඔෆ් සෙට් මුද්‍රණ ක්‍රමය ප්‍රචලිතව නොතිබුණ බැවින් අතින් අකුරු අමුණා රූ සටහන් බ්ලොක් වලින් සකස් කර පුවත්පතේ පිටු සකසන්නට අපට සිදුවිය. පුවත් පතේ මංගල කළාපය මුද්‍රණය කෙරුණේ එක්තරා කුඩා වාමාංශික දේශපාලන පක්ෂයක නිල පුවත්පත මුද්‍රණය කළ දෙහිවල නැදිමාල ප්‍රදේශයේ මුද්‍රණාලයකය. (ඒ දේශපාලන පක්ෂයේ නම දැන් මට මතක නැත) එදා පුවත්පත මුද්‍රණය කර අවසන් වන තුරු අපි සතර දෙනා මුද්‍රණ යන්ත්‍රය අසළට වී රැයක් පහන් වන තුරු කහට තේ බොමින් නිදි මැරුවෙමු. උදෑසන මුද්‍රණය කළ පිටුත් රැගෙන නුගේගොඩ මහ ගෙදරට අප ආවේ රටක් රාජ්‍යයක් ජය ගත්තා සේ ය.

පුවත්පත අප සිතුවාට වඩා ජනප්‍රිය විය. බෙදාහැරීම සම්පූර්ණයෙන්ම සිදු කෙරුණේ පාසල් හරහා ය. බොහෝ කාලයක් පුවත්පත මුද්‍රණය කෙරුණේ අභාවප්‍රාප්ත සිසිරකුමාර මාණික්කආරච්චි මහතාට අයත්ව තිබූ ගංගොඩවිල මුද්‍රණාලයක ය. වසරක් ගත වන විට එකතු වූ මුදල් යොදවා අපි අපේම වූ අකුරු ඇමිණීමේ අංශයක් ඇරඹුවෙමු. පුවත්පතේ සියලුම පිටු අකුරින් අකුර අමුණා පිටු සැකසීමේ පණ යන කාර්යය මගේ කර පිටටම වැටුණි. අද සේ ම එදත් පුවත් පතේ පිටුවක් සිත් ගන්නා ලෙස නිමා වනු දැකීමේ ආසාවෙන් පෙලුණ මම ඒ වගකීම සතුටින් බාර ගෙන ඉටු කළෙමි.

මුළ දී අකුරු තට්ටුවේ නියමිත අකුර ඇති තැන මතක තබා ගන්නට ඉතා අපහසු වූ නමුත් දින කීපයක් ගත වන විට මම සෑහෙන වේගයකින් අකුරු ඇමිණිය හැකි පළපුරුදු අකුරු අමුණන්නකු (වර්ණ සංයෝජකයකු) වූයෙමි. වර්ණ යනු අකුරු වලට යෙදෙන වෙනත් වචනයකි. සංයෝජනය යනු ඒ අකුරු එකට එක් කර වචන සෑදීමයි. අද අපි පරිගණක ආධාරයෙන් අකුරු එක් කරමින් මේ කරන්නේ ද වර්ණ සංයෝජනයයි.

අච්චු අකුරු සාදන්නේ ඊයම් වලිනි. මේ ඊයම් ඇසට නොපෙනී ක්‍රමයෙන් වාෂ්ප වන අතර අකුරු අමුණන්නා නොදැනුවත්වම විෂ සහිත ඊයම් වාෂ්ප ආඝ්‍රාණය කරයි. අකුරු අතින් අමුණා මුද්‍රණ කටයුතු කළ යුගයේ මුද්‍රණාල වල සේවය කළ බොහෝ අය පෙනහළු ආශ්‍රිත රෝග වලින් පීඩා වින්දේ ඒ නිසා විය යුතු ය.

අපි පුවත්පත්කරුවන් මිස පුවත්පත් වෙළෙන්දන් නොවූයෙන් පුවත් පතේ මිල නියම කෙරෙුනේ එය පවත්වාගෙන යා හැකි ආකාරයකට නොවන බව අප තේරුම් ගන්නා විට වසරකට වැඩි කාලයක් ගත වී තිබුණි. සිත්තර පත්තරයක් රුපියල් දෙකයි පනහකට විකුණන විට ඒ ප්‍රමාණයේම අපේ පුවත්පත රුපියලකට විකිණා පුවත්පත පවත්වාගෙන යාමේ හැකියාවක් නැතිබව තේරුම් ගන්නට තරම් ව්‍යාපාරික ඥානයක් අපට නොවී ය. මසකට පුවත්පත් පහළොස්දාහක හොඳ අලෙවියක් තිබූ අපේ පුවත්පත ක්‍රමයෙන් මුදල් අඟ හිඟ කම් වලින් පෙළෙන්නට විය.

මේ වන විට සිරිනිමල් ජවිපෙ පූර්ණකාලිකයකු වී සිටි බැවින් පුවත් පත කෙරෙහි ඔහුගේ අවධානයද ක්‍රමයෙන් ගිලිහෙමින් තිබුණි. අවසන වසර දෙකකට පමණ පසු අපටද නොදැනීම අපේ පුවත්පත වැසී ගියේ ය. ඉන් වසරකට පමණ පසු සිරිනිමල් මහ රැයක වාහනයක් රැගෙන විත් අපේ ගෙදර තිබූ මුද්‍රණ අකුරු, අකුරු දමන ලී තට්ටු (කේස්), ගලි, ඇතුළු උපකරණ සියල්ල මගෙන් ඉල්ලාගෙන ගියේ ය. ඒ සිය පක්ෂයේ වැඩ කටයුතු සඳහා විය යුතු ය.

මුද්‍රණයෙන් නිකුත් වූ මගේ පළමු පුවත් පතේ කතාව එතෙකින් අවසන් විය.

සිරිනිමල් අසූ නවයේ භීෂණයේදී ජීවිතයෙන් වන්දි ගෙවූ අතර සුමිත් පසු කලෙක සෞඛ්‍ය පරීක්ෂකවරයකු වූ බව දැන ගතිමි. දයාවංශ ඉන්පසු කිසිම දිනෙක මට හමු නොවී ය.

මේ සියල්ල සිදුවී දැන් වසර විසි පහකට වඩා ගත වී ඇත. තවමත් පුවත්පත් සමගම දිවි ගෙවන්නට ඉරණම විසින් මට නියම කරනු ලැබ තිබීම වාසනාවක් ද අවාසනාවක්ද යන්න තෝරා බේරා ගත නොහැකිව අදත් මම කල්පනා කරමින් සිටින්නෙමි.



**ස්කැටස් සංවිධානය මෙහෙයවූ මාලිනී ජයසිංහ රමණි ලියනාරච්චි හා දේවිකා රූපසිංහ අනුස්මරණ ප්‍රණාම උළෙලේ අවස්ථා කීපයක්**